ගීතයේ මයුරු සර වදනුසේන හෙට්ටිආරච්චි

සංගීත ලෝලී සුවහසක් ශ්‍රාවකයන්ගේ මනදොල සංසිඳුවාලමින් මිනිස් චින්තනයට ආමන්ත්‍රණය කළ ඒ ලයාන්විත වූ හඬ තුළින් ශ්‍රාවක සිත් සතන් තුළ සදා ලැගුම් ගත් ගායන ශිල්පී චන්ද්‍රසේන හෙට්ටිආරච්චිගේ මයුර වූද සුමධු වූද ගැඹුරු වූද මෝහනීය ස්වරය සදානුස්මරණීය බව පැවසීම අතිශයෝක්තියක් නම් නොවේ.

''අම්මා ජීවන උයන් තෙරේ
නොනිමි දැල්වෙන පහනකි
නිරන්තරේ
ඔබ මට සුවය ගෙනේ''

ඔහු ගැයූ ගීත අතරින් ශ්‍රාවක හදවතට ඉතාම සමීප වූ ගීතයක්. මව්වරුන් ගුණ කොතරම් ගීත ලියවුනද අම්මාවරුන් ගැණ මෙතරම්ම උණුසුම්ව ගැයෙයන පද වැලක් නැති තරමය. පියාගේ වියෝවෙන් පසුව ඔහුගේ ජීවන උයන සුවඳවත් කරන්නට දරිද්‍රතාවයේ ඝන අඳුර නසා රන් පහනක් දල්වන්නට ඉදැබ්ලයක් සේ ඔහු පසුපස සිටියේ ඔහුගේ සදාදරණීය මවයි. ලෝකයේ ඉහළම හිතිපෙත්තක සිට කිරුළු දරන්නට ඔහුට තම මවගේ ආශිර්වාදය පිටුවහලක් වන්නට ඇත. ඇගේ නෙත උපන් කඳුල ඔහුට ශක්තියක් හා ධෛර්යයක් වීම නොවැලැක්විය හැක්කක්ද විය.

ඔහු ගායනා කළ බොහෝ ගීතවල රැඳී ඇත්තේ හදවතින් ගලා ගෙන ඉපදුන වේදනාවයි. ජීවිතයේ කටුක දුෂ්කර බව පසක් කරමින් ගැයූ ගීතයි. වරෙක එම ගීත හදවත පසාරු කරගෙන යන්නට තරම් තියුණු විය. ඔහු ගැයූ ගීත බොහෝමයක් විරහ ගීත විය.

මල් මේණු පොඩි වීදෝ, යෙහෙලියක සේ, ඈත ඈත චන්ද්‍ර මණ්ඩලේ, සැංගුවද ආදරේ අපේ, මා සිතූ දේ, ආපසු යන්නට පාර කියනවද ඔබ මාගෙ නම්, සීත කඳු යාමේ

ආදී ගීත ශ්‍රී ලාංකීය ශ්‍රාවක සිත් තදින් ඇද බැඳ තැබීමට සමත් විය. අනුකරණයෙන් ඈත් වෙමින් තම ගායන වාදන සත් කාර්ය සනිටුහන් කරන්නට තමාටම ආවේනික වූ හැඩකින් ස්කීය අනන්‍යතාවය තහවුරු කරගන්නට සමත් වූ ගායකයන් අතලොස්සෙන් එක් අයෙකි. චන්ද්‍රසේන හෙට්ටිආරච්චි නම් මොහු ඔහුගේ ගීත ශ්‍රී ලාංකීය රසිකයන් දරාදා බවකින් වැළඳ ගන්නේද ඒ නිසාවෙනි.

තවත් වරෙක ඔහු දුක්විඳි ජනතාව වෙනුවෙන් ගීතයක් ගායනා කිරීම අමතක නොකළේය.

'ගැලපුරවා ගෙන හති හනිකේ
මේ දුරු කතර ගෙවා '

බුදු බැති ගීද වැඩි ගිය සිතින් ගීත ගායනා කළේය. විශාල ප්‍රමාණයක් ගීත නොගැයුවද ශ්‍රාවක බෞද්ධ ජනතාවගේ සිත් පහන් කරන්නට එම ගීත සමත් වූයේ යැයි පැවසීම අතිශයෝක්තියක් නම් නොවේ.

චන්ද්‍රසේන හෙට්ටිආරච්චි නම් මෙම කලා ශිල්පීයාගේ උපන් ගම යටියන්තොට ගරාගොඩ නම් සුන්දර ගමක්. මව මේරිනෝනා. ඔහුට වැඩිමල් සොයුරෙක් සහිත හයදෙනෙකුගෙන් යුත් පවුලක ඉපදීමට වරම් ලැබුණා. ඔහු සත්මහල් ප්‍රාසාදයකින් සංගීතයට පියවර තැබුවෙක් නොවේ. දුක හඳුනාගත් දුකින් උපත් කලාකරුවෙක්.

පොඩි අවධියේ සිටම සංගීතයට හා ගායනයට දැක්වූයේ දැඩි ලබැඳියාවක්. තම පියා ගමේ පිරිස එකතු කර මැන්ඩලීනය වාදනය කරමින් රැක්මණී දේවියගේ සිංදු ගායනා කිරීමට ශ්‍රී ලාංකීය ශ්‍රාවකයින්ට මහඟු කලාකරුවෙක් බිහිකරන්නට එයට පෙර නිමිත්තක් වන්නට ඇත. ඔහු පොඩි අවධියේ දී මුලින්ම පාසැලට ගියේ ගරාගොඩ සිංහල කනිෂ්ඨ විද්‍යාලය. පාසැලේදී විශේෂයෙන් සංගීතය හදාරා නැතත් පාසැල් වේදිකාව ඔහුගේ ගීත ගායනය ඔපවත් වන්නට තෝතැන්නක් වන්නට ඇත. ගමේ පැවැත්වෙන සංගීත සංදර්ශන වේදිකාවද ඔහුව කලාකරුවෙක් කරන්නට රතු පලසක් වන්නට ඇත.

''මම ඒ වෙනකොට පුංචි වෙළෙඳ ව්‍යාපාරිකයෙක් වෙලයි හිටියේ. ඒක යාළුවන්ට බාරදීලා යෞවන සම්මාන උළෙලට ලේලුම්පත්‍රයක් දැම්මා. අළුත් ගීතයකුත් නිර්මාණය කරලා මමම සංගීතය දාලා එතනට යොමු කළා. සතියකින් ලිපියක් ලැබුනා මගේ ගීතය තේරුණා කියලා. එදා තමයි අපේ ගෙදර අය වැඩියෙන්ම සතුටු උනේ. ඔහු සංගීත දිවියේ මුල්ම පියවර ගැන මෙහෙම කියාගෙන ගියා. අතීතයෙන් බිඳක් ඔහු නිරහංකාරව සිහිපත් කළා.

එදා ගාලාවේ සිටි ශ්‍රාවක පිරිසගේ සවනත ඔහුගේ ගැඹුරු වූ හැඟීම්බර මියුරු හඬ රැව් පිළිරැව් දෙන්නට ඇත. යෞවන සම්මාන උළෙලේ ප්‍රථම ස්ථානය ඔහුට හිමි වූ විට සිතේ කොපමණ සතුටක් දෝරගලා යන්නට ඇත්ද? මින් පසුව ඔහු තරුණ සේවා යොවුන් කණ්ඩායමට ද ආරාධනා ලැබීමට සංගීත දිවියේ සඩයිමි පුළුල් කරන්නක්ම විය. එහිදී ෂර්ලි වෛද්‍යයන්ත සමග ගායනා කළ 'තවලම් අපි යනවා' ගීතය එකළ ශ්‍රාවකයන් ගේ සිත් තදින් ඇඳ බැඳ ගත් ගීතයක් වූවා. එදා ඔහු සමඟ එක්ව සිටි චන්ද්‍රලේඛා පෙරේරා, සෝමසිරි මැදගෙදර, තේජා දමයන්ති අද ප්‍රවීන කලාකරුවන් අතර ඔහුගේ සංගීත දිවියට මහඟු අත්වැදෙක් ද වූවා. අද චන්ද්‍රසේන හෙට්ටිආරච්චි නම් මෙම කලාශිල්පියා සංගීත දිවියේ නිම්වළලු පුළුල් කරමින් කඩයිම් රාශියක් පසු කරමින් ශ්‍රාවක සිත් පහන් කරමින් ප්‍රසංග වේදිකාව රූපවාහිනී නාලිකා හා ගුවන් විදුලිය ජයගෙන තම ස්ථාවරයේ ... ඒව සිටීම වැදගත් වූ කරුණක් ලෙස සඳහන් කළ හැකියි.

මොහු ගීත ගායනයට පමණක් නොව සංගීතයටද දක්වන්නේ දැඩි වූ දක්ෂතාවයක්. ඒ දිනවලදී තරුණ සේවා යොවුන් කණ්ඩායමේදී නිහාල් ගම්හේවා යටතේ සංගීතය හදාරන්නට වාසනාව ලැබීම සංගීතය හැදීරීමේ ප්‍රධානම මාර්ගය වුණා. ඔහු ගායනා කර ඇති විශාල ගීත අතරින් බොහෝමයක් ඔහු ලියූ ගීත හා සංගීතය සැපයූ ගීතවීම අර්ථ පූර්ණ වූ කලා ශිල්පියෙක් වීමට විශේෂ දායකත්වයක් ලැබීම මෙහිදී විශේෂයෙන් දැක්විය යුතුය.

ඔහු ගැයූ ගීතයක් තරුණ හදවත් අමතන්න පුළුවන් අනුපමේය නිර්මාණ කෞශල්‍යයකින් පොහොසත් වූ ගීත නිර්මාණයන් නිස්කලංකව සෞම්ම මනසකින් ඉඳගෙන රස විඳිය හැකි ගීත ඔහු විසින් ගායනා කර ඇත්තේ නටන්න නොවෙයි විඳින්න පුළුවන් ගීතයි. ඔහු ගායනා කරන්නේ කැසට්පට හා සීඩී තැටි සංඛ්‍යාත්මක ලෙස විශාල ප්‍රමාණයක් නිකුත් නොකලද ඔහුගේ සෑම ගීතයක්ම ශ්‍රී ලාංකීය සහෘදෑ ප්‍රජාවගේ අති මහත් ප්‍රසාදය පිණිසම හේතුවිය.

අද සංගීතයට පිවිසෙන තරුණ පරම්පරාව පිළිබඳව කරුණු දක්වන මෙම සංගීත වේදියා පවසන්නේ සියලු පහසුකම්මත විද්‍යුත් මාධ්‍යයක් විවෘතව තිබුණද විශ්වාසය හා උනන්දුවද එයට අවශ්‍ය ප්‍රඵලම සාදකයක් බවයි. එපමණක් නොව හෙට දවස වෙනුවෙන් ඉදිරියට එන තරුණ පරම්පරාව ක්ෂෙත්‍ර පිළිබඳව අවබෝධයෙන් කලාව ගැන ඇත්තේ ආදරයෙන් කටයුතු කළ යුතුවාවත් ඔහුගේ බලාපොරොත්තුවයි.

කලාකරුවෙකුගෙන් ජනතාව බලාපොරොත්තු වන දෙයක් තියෙනවා. ජනතාව දැනුවත් කරාවි හැවුම් රසයක් උද්දීපනය කර පෙර ගමන්කරුවෙකු ලෙස සැබෑ දර්ශනයක් මත කටයුතු කිරීමයි. ජනතාවට ලං වෙනවා කියන්නේ නිස්සාර වූ හරසුන් ප්‍රමිතියකට නැති දේ ඉදිරිපත් කර ලංවීම නොවෙයි. අර්ථ පූර්ණ රස පූර්ණ නිර්මාණ තුළින් ඔවුනට, ඔවුන්ගේ හදවතට ලංවීමයි. පරිසමාජත අර්ථයෙන්ම චන්ද්‍රසේන හෙට්ටිආරච්චි නම් කලාකරුවා මේ සියලු ගුණයෙන් සපිරි අයෙකු වීම අප ලද භාග්‍යයක් සේ විය. පෙබරවාරි මස 25 වෙනදා ක්ලේටන් නගර ශාලාව හිදී ශිල්පී චන්දන ලියනආරච්චි සමග පැවැත්වෙන සංගීත සංදර්ශනය සාර්ථක වේවායි සුභ පතමු.

වේළුවනාරාමයේදී

මේක හද සසල කරන දසුනක්. තැන බුදුන් වැඩ වාසය කළ වේළුවනාරාම අසල තපෝදා නදියයි. වේළුවනාරාමය කිව්වට එතන දැන් එක උන ගහක් වත් නැහැ. හින්දුන් ගේ සොහොන් පිටියක් සමග බෞද්ධ නටඹුන් ස්වල්පයක් තියෙනවා. මේ නාන පොකුණ ඇත්තේ ඊට මඳක් ඉහළට වන්න ඇති කුඩා කඳු ගැටයකයි. බොහෝ වන්දනාකාරයන්ගේ අවධානයට මෙය ලක්වෙන්න් නැහැ. සැවොම හිතන්නේ එය නිකම් නාන පොකුණක් ලෙසයි. සත්‍යය ඊට බොහෝ සෙයින් වෙනස්.

ඔබ මේ දකින නාන පොකුණ පිහිටා ඇත්තේ පොකුනු තුනක ඉහළම පොකුණ වශයෙන්. . දෙවැනි පොකුණ මීට මීටරයක් පමණ පහළින් සහ තෙවැනි පොකුණ ඊටත් මීටරයක් පමණ පහළින් පිහිටා තියෙනවා.

මේ පොකුනු වලට ජලය ලැබෙන්නේ තපෝදා නදියෙන්. නදියක් කිව්වට ඒක අඩල පාරක් වගෙයි. එයින් ඉහළම පොකුණට ජලය ලැබෙනවා.

ඉන්දියාවේ බොහෝ ජනතාවක් මෙතැනට නෑම සඳහා පැමිණෙනවා. පොකුනු තුනම විවෘතව ඇත්තේ නෑම සඳහා. ඒත් නෑම සිදු කළ යුත්තේ කුල අනුවයි. එනම් ඉහලම කුල සඳහා සංකීර්නයේ ඉහලම පොකුනත් ඊළඟ කුල වල අයට දෙවෙනි පොකුනත් පහලම කුල වල අයට පහලම පොකුනත් වශයෙන්. ඇස් අදහා ගන්න බැරි හේතුව වන්නේ මෙයයි. මේ ඔබ දිකින ඡායාරූපයේ දකින්නේ ඉහලම පොකුනේ නාන මිනිසුනුයි. අඩි 15- 15 පොකුනක 50 ක් විතර කිටි කිටියේ නානවා. මේ මිනිසුන් නාන වතුර තමයි පහල ඇති පොකුනට ගලා යන්නේ. ඒ වතුරිනුයි දෙවැනි පොකුන පිරෙන්නේ. ඒ පොකුනේ නාන මිනිසුන් නාන්නේ උඩහින් එන අර අපිරිසිදු වතුරයි. තෙවැනි පොකුනේ මිනිසුන් නාන්නේ උඩහ පොකුනු දෙකේම මිනිසුන් නාපු ඉතා අපිරිසිදු කලුම කලු පැහැ වතුරයි. ඒ අපිරිසිදු වතුරේ ඔවුන් පීන පීනා නානවා. දුටු විට ඇති වන්නේ අපුලක් ඔක්කාරයක්. ඒත් මේ මිනිසුන් කිසිම ප්‍රශ්ණයක් නැතිව ස්නානය කර සතුටින් විසිර යනවා.

අදටත් මේ කුල භේදය මේ තරම් පවතිනවා නම් බුදුන් වහන්සේ මෙයට විරුද්ධව කරන ලද සටන කෙතරම් අසීරු වන්න ඇද්ද? ලෝකය එක යායක්, විශ්ව ගම්මාන සංකල්ප.. මේවා සිදුවන්න තව කල්පයක් විතර යාවි. ඉන්දියාවේ මේ කුල බේදය නැති කරන්න තවත් කල්පයක් විතර යාවි.

ජේතවනයේ දී

භක්තිය විසින් බොහෝ විට සත්‍යය හා යථාර්ථය යටපත් කිරීම හෝ සඟවාගෙන සිටීම පෙර සිටම සිදුවුණ දෙයක්. වැරැද්ද අඩුපාඩුව දැක දැක මිනිසුන් නිහඬව සිටින්නේ ඒ ගැන කතා කිරීමෙන් වන හානිය හා ප්‍රතිඵලය විඳගන්න අමාරු වන නිසා වෙන්න ඇති. ඉහත දැක්වෙන ඡායාරූපය දෙවිදිහකට අර්ථ දක්වන්න පුලුවන්. ස්ථානය නම් බෞද්ධයන්ගේ අති පූජනීය ස්ථානයයි. බුදුන් අවුරුදු ගණනාවක් වැඩ සිටි ජේතවනාරාමය අසල දී මේ ස්වාමීන් වහනසේ දුටු වනම මට ඇති උනේ දැඩි අපහසුවක්. ධර්මය හිස් මුදුනින් අදඳහුවේ නැති උවත් හික්සුවකට අපේ ඇත්තේ දැඩි ගෞරවයක් හා භක්තියක්. සිව්රක් පොරවාගෙන අතේ තඩි ඔරලෝසුවක් බැඳගෙන මෝටර් සයිකලයක නැගලා ඔබට ඇහැකුත් ගහගෙන ඔබ ඉදිරියට හික්සුවක් ආවොත් ඇති වන හැඟීම කොබඳුද?

රාහුල හාමුදුරුවන්ගේ හික්ෂුවකගේ මග පොතේ උන්වහන්සේලාගේ කාර්යය මනාව පැහැදිලි කරලා තියෙනවා. ඒ අසුරින්ම නොවුනත් බුදුන් උපන් දේශයේ උන් වහන්සේ වැඩි කලක් වැඩ වාසය කළ ස්ථානයේ හික්ෂුවක් චන්ඩියෙකු සේ ගෙස්ට් හවුස් එකක් පාලනය කරන අයුරු දුටු විට ඇතිවන හැඟීම විස්තර කරන්න පුලුවන්ද?

මේ රූපයේ අනෙක් පැත්ත නම් උන්වහන්සේ පාලනය කරන ගෙස්ට් හවුස් එක නැත්නම් බොහෝ වන්දනා කරුවන්ට ඉන්න තැනක් නැහැ. විවිධ මරිටමේ කාමර වලට විවිධ ගනන් අය කලත් මෙයින් ලොකු සහනයක් වන්දනා කරුවන්ට සැලසෙනවා. හින්දුන් මෝගල් වරුන් ඉන්දියාවේ බෞද්ධ උරුමයන් විනාශ කර ඇති ආකාරය බලන විට ඉන්දියාවේදීම ඒ ජනතාව අතරම වතුර ලෙස හින්දි භාෂාව හසුරුවමින් හින්දුන් තැති ගන්වමින් අධිකාරි බලයක් පවත්වාගෙන ගියේ නැත්නම් අපට සහහර විට ඕවා බලන්න වෙන්නෙත් නැහැ. හැම දේකම පැති දෙකක් තිබෙනවා. ඒ මොනවා කලත් උන්වහන්සේගේ ස්වභාවය හැසිරීම දුටු විට අපේ භක්තිය නම් පහල යනවා.

නිදහස

නිදහස කියන වචනයම වුවත් මිනිසුන්ගේ සිත්තුල යම් පිබිදීමක් ඇති කරනවා. ඒක මිනිසුන්ට පමනක් නෙවෙයි සතුන්ටත් පොදුයි. ලිවීමේ කියවීමේ ජීවත්වීමේ නිදහස යනාදී වශයෙන් අපට මේක විග්‍රහ කරන්න පුලුවන්.

සැබවින්ම නිදහස කියන්නේ හැඟීමක් දැනීමක්. ඒක අපට කිසිවකු තුළ බලෙන් ඇති කරවිය හැකි දෙයක් නොවෙයි. නිදහස කියන වචනය තුල ගැබ්ව ඇති අර්ථය පන ගැන්වෙන්නේ වැඩ පිළිවෙලක් කැපවීමක් පරිත්‍යාගයක් නිසා. ඒ නිසාම තමයි නොමිලේ නිකම් ලැබෙන නිදහස ඇඟට දැනෙන්නේ නැත්තේ. නිදහස යනු බන්දේසිය තබා නොමිලේ ලැබිය යුතු දෙයක් නොව ලබාගත යුතු දෙයක්.

මෙවරත් 4 වන දා අපි නිදහස සමරන්න සූදානම් වෙනවා. ප්‍රභූන්ගේ සහභාගිත්වයෙන් ජාතික සංස්කෘතික අංග වලින් සැරසී උත්සවය පැය කීපයක් පැවැත්වේවි. ඒත් අවුරුද්දේද දවස් 364 ක්ම අපේ කමෙන් ඈත් වෙලා ජාතිකත්වයෙන් මිදිලා එක දවසකට විතරක් සීමා වෙන මේ වැඩෙන් පලක් තියෙයිද? නිදහස සැමරීම අර්ථාන්විත වෙන්න නම් අපට ඒ හා බැඳුන ජාතික වැඩ පිළිවලක් තියෙන් ඒනෙ. එක දහඩිය බිඳක් වතෙ ානසෙල්වා ලබා ගත් නිදහස ලැබී අඩ සිය වසකටත් පසු හරි හැටි ජාතික වැඩ පිළිවෙලක් නැති. අපට මෙල්බන් වලින් ඒක බලාපොරොත්තු වෙන්න පුලුවන්ද? ජාතික වැඩ පිළිවෙලක් කියා අපට නිදහස ලැබුනේ කොහෝමද කියා දන්නෙ කීයෙන් කී දෙනා ද. අපි පටන් ගන්න ඒනෙ එතනින්. 4 වෙනිදා ඒකට හොඳ දවසක්.

රටකට තානාපති වරු කොන්සල් වරු පත් කරලා ඉන්නෙ ඒවට තමයි. නිවැරදි වැඩ සටහනක් පටන් ගන්න. ජනතාව ඔබ සමග සිටීවි ■